THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP

Funded by
The European Union



# පැපොල්

## අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට වගා කරමු.

# තවාන් පාලනය

## NURSERY MANAGEMENT

HIGH DENSITY DOUBLE ROW

01

කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය



ඉහළ පෝෂණ ගුණයකින් හෙබි රසවත්
පලතුරක් වන

# පැපොල්

වාණිජ වගාවක් ලෙස වගා කෙරේ.

කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය
ගොවි ජනතාවට ලබාදෙමින් පැපොල්
වගාව තුළින් වඩාත් උසස් ගුණාත්මක
හා ප්‍රමාණාත්මක අස්වැන්නක් ලබා
ගැනීමේ අරමුණ ඇතිවය.

# පැපොල්

අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට
**වගා කරමු.**

## තවාන් පාලනය

පැපොල් වගාවේ දී සාර්ථක ගුණාත්මක වාණිජ වගාවක් ලබා ගැනීමට **පැපොල්** තවාන් පාලනය ඉතා වැදගත් වේ. මෙහිදී ආකාර කිහිපයකට තවාන් පාලනය සිදුකළ හැකි අතර මෙමඟින් නිරෝගී දිරියක් සහිත පැළයක් ලබා ගැනීම අරමුණු කෙරේ.

### ප්‍රභේදය

1 බීජ ග්‍රෑම් 10 ක 680 - 700 ක් අඩංගු වේ.





## ප්‍රභේදය

**තායිනන්ග්** (Tainung 1)

සාමාන්‍යයෙන් 1.1 kg බරැති,

සෙ.මී 22.5 X 9.5

විශාල ඕවලාකාර හැඩැති,

මඳය ඉතා රසවත් පලතුරකි.( Brix 11%)

## ප්‍රරෝහණය 95% - 98% පැවතිය යුතුය.

### තවාන් කිරීම

තවානේ සිටුවීමට පෙර බීජ ප්‍රතිකාර කළ යුතුය. මෙහිදී කැප්ටාන්/ කෲසර්

1. කෲසර් කෘමි නාශකය


2. කැප්ටාන් දිලීර නාශකය

### තවාන් මාධ්‍යය සැකසීම

මතුපිට පස් : කොම්පෝස්ට් : වැලි හා කර දහයියා 1 : 1 : 1 : 1 මිශ්‍රණයකින් තවාන් බඳුන් පුරවා ගන්න.



**තවාන් තැටි / තවාන් බඳුන් රඳවා තබා ගැනීම සඳහා මැස්සක් යොදා ගන්න.**





මෙමඟින්,

- වඩාත් පහසුවෙන් තවානේ ක්‍රියාකාරකම් සිදුකළ හැක.
- තවාන නිරීක්ෂණය පහසු වේ.
- පළිබෝධ හානි සඳහා පාත්‍රී වීම අඩු වේ.
- තවානේ අවධානම ද අඩුවේ.
- තවාන වර්ෂා ජලයෙන් සේදී නොයයි.
- සුළඟින් හානි නොවේ.
- විවිධ සතුන්ගෙන් හානි නොවේ.
- පැළ දැඩි කිරීම ඉතා පහසුය.

## තවානේ බීජ සිටුවීම

1. පැය 10ක් පැපොල් බීජ පෙඟෙන්නට තබන්න.
2. දිය බේරෙන්නට තබා කෘමි හානි සඳහා වන බීජ ප්‍රතිකාරකයක් (කෘසර්) සමඟ නිර්දේශිත ප්‍රමාණයන්ගෙන් මිශ්‍ර කර දිලීර නාශකයකින් (ටොප්සීන්) බීජ ප්‍රතිකාර කර මඳ පවනේ වියළා ගන්න.
3. බීජ පැළ කළු පැහැති පොලිඑතිලීන් බෑග්වල වගා කළ යුතුය.
4. බෑග් වල විශාලත්වය සෙන්ටිමීටර 12.5 ක් සහ උස සෙන්ටිමීටර 20කි.
5. තවාන් මිශ්‍රණයෙන් බෑග් පුරවා ගන්න.
6. එහි මධ්‍යස්ථයේ බීජ සිටුවා ගන්න.
7. දිලීර නාශකයකින් තවාන හොඳින් තෙමන්න.
   ටොප්සීන් (6g + 10l)

**සති 6ක තවාන් කාලයකින් පසු කෙෂ්ත්‍රයේ සිටුවීමේ හැකියාව ඇත.**
**තවාන් පැළයක්,**

- හොඳින් සංවර්ධිත මූල පද්ධතියක් තිබිය යුතුය.
- ශාකයේ ප්‍රධාන කඳේ 15 සිට 20 දක්වා විය යුතුය.
- පැන්සල් විෂ්කම්භයක් සහිත අවම වශයෙන් කොළ පැහැති කොළ 3-4 සහිත විය යුතුය.

**ආරක්ෂිත ගෘහයක ඉදිකළ උස් මැස්සක් මත මෙම තවාන් තැටි/ තවාන් බඳුන් තබන්න.**

- දින 7 සිට 21 දක්වා ප්‍රරෝහණය වීම සිදුවේ.
- දින 35-45 අතර කාලයක් තවාන් නඩත්තු කරන තවාන් පැළ දින 45 ට පෙර අනිවාර්යයෙන් ක්ෂේත්‍රයේ සිටුවිය යුතුය.

# පැපොල්

අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට
වගා කරමු.

## ප්‍රකාශන කට්ටලය

1. තවාන් පාලනය
2. බිම් සකස් කිරීම හා ජල සම්පාදන පද්ධති ස්ථාපනය
3. පැළ සිටුවීම හා අතුරු බෝග වගාව ජල සම්පාදනය හා පොහොර යෙදීම



# පැපොල්

අධි ඝනත්ව දෙපේළි ක්‍රමයට වගා කරමු.

## තවාන් පාලනය

NURSERY MANAGEMENT